ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## පුවත්පත් නිවේදනය

### ඉන්දීය මහ කොමසාරිස්තුමා ගංගාරාම විහාරස්ථානය සහ ශාන්ත අන්තෝනි දේවස්ථානය වැඳ පුදා ගනී

ශ්‍රී ලංකාවේ නව ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මැතිතුමා අද උදෑසන කොළඹ ගංගාරාම විහාරස්ථානයට ගොස් බුදුන් වහන්සේට සිය නමස්කාරය පුද කර ශ්‍රී ලාංකික සහ ඉන්දීය ජනතාව වෙනුවෙන් නීරෝගීභාවය, සාමය සහ සෞභාග්‍යය මෙන්ම ඔවුන් අතර මිත්‍රත්වය සහ සහයෝගීතාවය ප්‍රාර්ථනා කළේය. 2020 මැයි මස 8 වන දින ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලද ඖෂධ සහ වෛද්‍ය අයිතම තොගයක් රැගත් විශේෂ ගුවන් යානයකින් දිවයිනට පැමිණි එතුමා නිර්දේශිත සෞඛ්‍ය පිළිවෙත් පිළිපැදීමෙන් අනතුරුව සිය නිල නිවසෙන් බැහැරට පැමිණි පළමු අවස්ථාව මෙයයි.

2. විහාරස්ථානයට පැමිණි මහ කොමසාරිස්තුමා පූජ්‍ය ආචාර්ය කිරින්දේ අස්සජි හිමියන් විසින් පිළිගනු ලැබීය. එහිදී එම හිමියන් 2017 වසරේ ශ්‍රී ලංකාවේ පැවති අන්තර්ජාතික වෙසක් දින සැමරුම අවස්ථාවේදී අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා විහාරස්ථානයට පැමිණි බව සිහිපත් කළේය. පූජ්‍ය අස්සජි හිමියන් විහාරස්ථානයේ ප්‍රදර්ශනය කර තිබෙන එම වැදගත් සංචාරයේ ඡායාරූපද මහ කොමසාරිස්තුමාට පෙන්වූයේය. එසේම, තමන් වහන්සේ ඉන්දියාවේ අධ්‍යාපනය ලැබූ කාලය පිළිබඳවද සිහිපත් කළ උන්වහන්සේ දෙරට අතර පවතින එවන් බැඳීම්හි වැදගත්කම පෙන්වා දුන්නේය. උන්වහන්සේ මහ කොමසාරිස් බාග්ලේ මැතිතුමාට පිරිත් නූලක්ද ගැට ගසා ආශිර්වාද කළේය. මහ කොමසාරිස්තුමා විශේෂයෙන්ම ශ්‍රී ලංකාව සමඟ පවත්නා ඓතිහාසික, ගැඹුරු ශිෂ්ටාචාරමය, ආගමික සහ සංස්කෘතික බැඳීම් ඇතුළු සියලු ආකාරයේ සබඳතා ශක්තිමත් කර ගැනීමට ඉන්දීය නායකත්වය දරන කැපවීම මෙහිදී අවධාරණය කළේය.

3. ඉන් අනතුරුව මහ කොමසාරිස්තුමා පසුගිය වසරේ පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත් වූවන්ට උපහාර දැක්වීම සඳහා ශාන්ත අන්තෝනි දේවස්ථානය වෙත ගියේය. ප්‍රහාරයෙන් අනතුරුව හැකි වූ පළමු අවස්ථාවේදීම අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා ශ්‍රී ලංකාව වෙත එකමුතු බව පළ කිරීම සඳහා දිවයිනට පැමිණි බවත් එහිදී ශාන්ත අන්තෝනි දේවස්ථානයටද පැමිණි බවත් එතුමා සිහිපත් කළේය. මෙහිදී මහ කොමසාරිස්තුමා දෙරටෙහි සාමය, සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව වෙනුවෙන් ප්‍රාර්ථනා කළේය. දේවස්ථානයේ පරිපාලක ජූඩ් රාජ් පියතුමා දෙරටෙහි ජනතාවගේ නීරෝගීභාවය සහ ප්‍රීතිමත්භාවය උදෙසා ආශිර්වාද කළේය. අසල්වැසි රාජ්‍යයන් දෙක අතර පවත්නා සමීප මිත්‍රත්වය වඩා ශක්තිමත් කිරීම වෙනුවෙන් මහ කොමසාරිස්තුමාගේ කාර්යභාරයටද පියතුමා ආශිර්වාද එක් කළේය.

4. දෙරටෙහි ජනතාව අතර පවතින සබඳතා ඇතුළු ශ්‍රී ලංකාව සමඟ තිබෙන ශක්තිමත් සමස්ත සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා ඉන්දියාව දක්වන දැඩි කැපවීම මහ කොමසාරිස්තුමා මෙහිදී අවධාරණය කළේය.

*****

කොළඹ

ශක වර්ෂ 1942 ජ්‍යෙෂ්ත 2

2020 මැයි 23